සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2022
Practice Test - Grade 13 - 2022

# යුරෝපා ඉතිහාසය - II

25B S I

කාලය පැය තුනයි.

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය ලබාදෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න

විභාග අංකයඃ ............................................

<u>උපදෙස්</u>

* මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
* එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
* I කොටසට පිළිතුර ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමග අමුණා භාර දෙන්න.

- **01 සිට -10 දක්වා එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති නම් පහෙන් එකක් අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නම හඳුනාගෙන එහි අංකය වරහන් තුළ ලියන්න.**

1. i) ඇසොව් ii) ඇල්ප්ස් iii) ඇපිනයින් iv) කොකේසස් v) පිරනීස් (   )

2. i) තීබ්ස් ii) මෙගාර iii) මර්මරා iv) කොරින්ත් v) මිලේටස් (   )

3. i) හොරස් ii) ඔවිඩ් iii) ලිවි iv) ටැසිටස් v) ඇලරික් (   )

4. i) ජර්මනිය ii) ඉතාලිය iii) ජපානය iv) හංගේරියාව v) ප්‍රංශය (   )

5. i) ඇඩොල්ෆ් හිට්ලර් ii) බෙනිටෝ මුසෝලිනි iii) වින්ස්ටන් චර්චිල් iv) වික්ටෝරියෝ ඕර්ලැන්ඩෝ v) ෆ්‍රැන්ක්ලින් රූස්වෙල්ට් (   )

6. i) කාබොනාරි ව්‍යාපාරය ii) තරුණ ඉතාලි ව්‍යාපාරය iii) නව ගුවෙල්ප් ව්‍යාපාරය iv) දාස් කැපිටාල් ව්‍යාපාරය v) ජාතිකවාදි ව්‍යාපාරය (   )

7. i) ලොම්බාර්ඩි ii) ටස්කනි iii) වයිමාර් iv) පිඩ්මොන්ට් v) නේපල්ස් (   )

8. i) නයිල් සටන ii) ට්‍රැෆල්ගාර් සටන iii) සෙඩාන් සටන iv) වෝටර්ලූ සටන v) ඔස්ටර්ලිට්ස් සටන (   )

9. i) මතියාස් ii) මැක්සිමිලියන් iii) ගුස්ටාවුස්
iv) වොලන්ස්ටයින් v) නෙකර් ( )

10. i) චාල්ස් කැලොන් ii) අබේසියෙස් iii) මිරාබෝ
iv) ජින් පෝල් මරාත් v) ජෝර්ජ් ජැක් ඩැන්ටන් ( )

* **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් යුගලයක පද එකනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.**

11 1) හතරවන හෙන්රි - නැන්ට්ස් ආඥාව පැනවීම
2) රිචලියු - හියුගනෝවරුන්ගේ දේශපාලන බලය අහෝසි කිරීම
3) මැසරින් - තිස් අවුරුදු යුද්ධය ජය ගැනීම
4) 13 වන ලූවි - හත් අවුරුදු යුද්ධය ජය ගැනීම
5) දාහතරවන ලුවී - බිසෝවරුන්ගේ යුද්ධයට සම්බන්ධ වීම ( )

12 1) එලි විට්නි - කොට්න්ජින්
2) හෙන්රි බෙල් - දුම් බෝට්ටුව
3) විලියම් සිමන්ස් - විවෘත උදුන් ක්‍රමය
4) සැමුවෙල් මෝස් - විදුලි පණිවුඩ ක්‍රමය
5) සයිරස් ඩබ්ලිව් පිල්ඩ් - කේබල් ක්‍රමය ( )

13 1) ස්පාඤ්ඤය - පර්ඩිනන්ඩ් ඉසබෙලා යුවළ
2) ප්‍රංශය - හතරවන හෙන්රි
3) පෘතුගාලය - නාවික හෙන්රි
4) එංගලන්තය - හත්වන හෙන්රි
5) ඉතාලිය - දෙවන පිලිප් ( )

14 1) දෙවෙනි ඇලෙක්සැන්ඩර් සාර් - ප්‍රවේණි දාසයන් නිදහස් කිරීම
2) දෙවෙනි නිකලස් සාර් - ජපානය සමඟ කළ යුද්ධයෙන් පරාජය වීම
3) කෙරෙන්ස්කි - මෙන්ෂවික් පක්ෂය
4) වී.අයි ලෙනින් - බෝල්ෂවික් පක්ෂය
5) ජෝසප් ස්ටාලින් - ට්‍රොට්ස්කි සමඟ ගැටුමෙන් පරාජයට පත්වීම ( )

15 1) උත්කෘෂ්ට විප්ලවය - පාර්ලිමේන්තුව ජයග්‍රහනය කිරීම
2) ඇමරිකන් විප්ලවය - අයිතිවාසිකම් පනත
3) ප්‍රංශ විප්ලවය - මිනිස් අයිතවාසිකම් ප්‍රකාශනය
4) ජාතීන්ගේ සංගමය - මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය
5) රුසියන් විප්ලවය - නිර්ධන පාන්තික ආඥාදායකත්වය ( )

* **16 සිට 20 තෙක් ප්‍රශ්නවල x තීරුව y තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කල විට පහත ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගයට අයත් අංක තෝරා වරහන් තුළ ලියන්න**

16. x — y

1) ඇරිස්ටෝටල් - (A) ''විප්ලවය යනු මම වෙමි.
2) හිපොක්‍රටීස් - (B) ''මිනිසා දේශපාලන සත්වයෙකි.
3) නැපෝලියන් බොනපාට් - (C) ''අධිරාජ්‍යවාදය යනු ධනවාදයේ උච්චතම අවස්ථාවයි
4) ජුලියස් සීසර් - (D) ''මම පැමිණියෙමි. මම දුටිමි. මම ජය ගතිමි.
5) වී.අයි.ලෙනින් - (E) ''සෑම රෝගයකටම ස්වභාවික හේතුවක් ඇත.

i) ABEDC ii.) BEDAC iii) BEADC
iv) CDBAE v) BAEDC ( )

17. x — y

1) මානව වාදය - (A) ඇල්බට් අයිස්ටයින්
2) සාපේක්ෂවාදි න්‍යාය - (B) චාල්ස් ඩාවින්
3) උපයෝගීතාවාදය - (C) ජෙරමි බෙන්තම්
4) පරිනාමවාදී න්‍යාය - (D) රූසෝ
5) සාමාජ සම්මුතිවාදය - (E) ෆැන්සිස් පෙට්රාක්

i) EACBD ii.) ACDBE iii) EABCD
iv) CBDEA v) CBADE ( )

18. x — y

1) ජාත්‍යන්තර කම්කරු සංවිධානය - (A) හේග්
2) එක්සත් ජාතින්ගේ සංවිධානය - (B) රෝමය
3) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල - (C) ජිනීවා
4) ලෝක ආහාර වැඩපිළිවෙළ - (D) වොෂිංටන්
5) ජාත්‍යන්තර අධිකරණය - (E) නිව්යෝර්ක්

i) ACDBE ii.) CBEAD iii) BCDAE iv) EDACB v) EBCAD
( )

19. x — y

1) වින්ස්ටන් චර්චිල් - (A) ඉතාලිය
2) චාල්ස් ඩිගෝල් - (B) රුසියාව
3) හින්ඩන් බර්ග් - (C) එංගලන්තය
4) ජෝශප් ස්ටාලින් - (D) ප්‍රංශය
5) බෙනිටෝ මුසෝලිනී - (E) ජර්මනිය

i) CDEBA ii.) ABCDE iii) DEBAC
iv) EBACD v) BACDE ( )

20. x y

| | | |
|---|---|---|
| 1) යුගෙස්ලාවියාව | - | (A) සුකර්ණෝ |
| 2) මිසරය | - | (B) ජවහල්ලාල් නේරු |
| 3) ඉන්දියාව | - | (C) මාර්ෂල් ටිටෝ |
| 4) ඉන්දුනීසියාව | - | (D) ගීතිකා කෘෂෙෆ් |
| 5) රුසියාව | - | (E) අබ්දුල් ගමාල් නසාර් |

i) DECBA ii.) ADBCE iii) BDCAE

iv) EBCAD v) CEBAD ( )

*** 21 සිට 23 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු 5 බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය නොගැළපෙන පිළිතුර තෝරා එහි අංකය වරහන් තුල ලියන්න.**

21. ජාතික රාජ්‍ය

1) බල සංකේන්ද්‍රණය
2) වංශවතුන්ගේ බලය වැඩිවීම
3) ස්ථිර යුද්ධ හමුදාව
4) වෙළදාම පුළුල් වීම
5) වානිජ වාදය ( )

22 ජර්මනිය එක්සත් කිරිම

1) 1848 ෆ්‍රැන්ක්ෆර්ට් සම්මේලනය අසාර්ථක විම
2) 1860 දි ගැරිබෝල්ඩි විසින් නේපලස් සහ සිසිලිය අල්ලා ගැනීම
3) 1866 දී සත් සති යුද්ධයේදි ප්‍රෂියාව ජය ලැබිම
4) 1870 - 71 ප්‍රංශ - ප්‍රෂියානු යුද්ධයෙන් ප්‍රශියාව ජය ගැනීම
5) 1871 දී I විලියම් කෛසර් යටතේ ජර්මන් අධිරාජ්‍ය ප්‍රකාශයට පත් කිරීම. ( )

23. II වැනි ලෝක යුද්ධයක් ඇතිවීම වලක්වා ගැනිම සඳහා දරන ලද ප්‍රයත්න.

1) 1919 දි ජාතින්ගේ සංගමය පිහිටුවීම.
2) 1925 දී ලෝකාර්නෝ ගිවිසුම අත්සන් කිරීම.
3) 1932 නිරායුධකරණ සම්මේලනය.
4) 1935 දී ඉතාලිය ජාතීන්ගේ සංගමයෙන් ඉවත්වීම.
5) 1938 මියුනික් සමථය ( )

24. ප්‍රංශ විප්ලවය

1) පැරණි රාජාණ්ඩු ක්‍රමයේ දුර්වලතා ප්‍රංශ විල්පවයට තුඩු දුන් හේතුවක් විය.
2) වෝල්ටෙයාර් ප්‍රංශ විප්ලවයට බලපෑ දාර්ශනිකයෙකු විය.
3) 1789 මැයි මස ස්ටේට්ස් ජෙනරාල් සභාව රැස්වීම
4) 1789 ජූලි මාසයේ බැස්ටීලයට පහර දීම
5) 1793 ජනවාරි මාසයේ xvi වන ලුවී රජුට ඔටුනු පැළඳවීම. ( )

25. එක්සත් ජාතීන්ගේ සංවිධානය සම්බන්ධ වූ ප්‍රධාන අර්බුද

1) මොරොක්කෝ අර්බුදය
2) කොරියන් යුද්ධය
3) සුවස් අර්බුදය
4) බෙල්ජියන් කොංගෝවේ සිවිල් යුද්ධය
5) කාශ්මීර අර්බුදය ( )

* **26 -30 තෙක් ප්‍රශ්නවලට දක්වා ඇති ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,**

(A) හා (B) පමණක් නිවැරදි නම් 1ද

(A) හා (C) පමණක් නිවැරදි නම් 2ද

(B) හා (C) පමණක් නිවැරදි නම් 3ද

(C) හා (D) පමණක් නිවැරදි නම් 4ද

වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් 5 ද ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| (1) | (2) | (3) | (4) | (5) |
| (A) සහ (B) පමණක් නිවැරදිය | (A) සහ (C) පමණක් නිවැරදිය | (B) සහ (C) පමණක් නිවැරදිය | (C) සහ (D) පමණක් නිවැරදිය | වෙනත් ප්‍රතිචාර සංඛයාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදිය |

26. පහත දැක්වෙන්නන් අතුරෙන් බ්‍රිතාන්‍ය ආක්‍රමණය කළ ම්ලේච්ඡ ගෝත්‍ර කවරේද?

(A) ඔස්ට්‍රොගොත්වරු (B) ෆ්‍රැන්ක්වරු (C) ඇංගල්වරු (D) සැක්සන්වරු

( )

27. පහත දැක්වෙන දෑ අතුරෙන් ප්‍රතිරෙපරමාදුවේ ප්‍රධාන අංග කවරේද?

(A) ජේසු සංගමය
(B) ජිනීවාහි කැල්වින්වාදි පල්ලිය
(C) ට්‍රෙන්ට් සම්මේලනය
(D) අධර්ම මර්දනාධිකරණය ( )

28. එංගලන්ත පාර්ලිමේනතු ක්‍රමයේ වර්ධනය සම්බන්ධයෙන් නොගැළපෙන පිළිතුර තෝරන්න

(A) මහා සභාව
(B) මැග්නාකාර්ටා ප්‍රඥප්තිය
(C) බැරන්වරුන්ගේ ආණ්ඩුව
(D) ඩුමා පාර්ලිමේන්තුව ( )

29. කාර්මික විප්ලවයට අදාළ වන සිදුවීම් තෝරන්න

(A) ඉඩම් කොටු කිරීම මගින් මහා පරිමාණ ගොවි බිම් බිහි විය
(B) හෙන්රි බෙසර්මන් පහසුවෙන් යකඩ නිපදවීමේ ක්‍රමය සොයා ගන්නා ලදී
(C) ගැලීලියෝ ගැලීලිගේ දුරදක්නය නිපදවීම වැදගත්ය
(D) මුද්‍රණ යන්ත්‍රය සොයා ගැනීමෙන් වැඩිදෙනෙකුට පොත් කියවීමේ අවස්ථාව ලැබුණි. ( )

30. පහත දැක්වෙන්නන් අතුරෙන් එංගලන්තය නියෝජනය කරන දේශගවේශකයන් කවුද?

(A) ජැක්විස් කාටියර්
(B) ෆ්‍රැන්සිස් ඩ්‍රේක්
(C) ගිල්බර්ට්
(D) ෆ්‍රැන්සිස්කෝ පිසරෝ ( )

*** අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

31. එංගලන්තයේ සර්වජන ඡන්දබලය ක්‍රියාත්මක වූයේ කුමන වර්ෂයේද?

1) 1833 2) 1858 3) 1872 4) 1918 5) 1928 ( )

32. පාප්වරුන්ගේ පාරම්පරික මධ්‍යස්ථානය පිහිටියේ කොහේද?

1) අවිකොක් 2) ලන්ඩන් 3) මාසෙල්ස්
4) රෝමය 5) ජිනෝවා ( )

33. වියානා සම්මේලනයට ප්‍රශියාව නියෝජනය කරමින් සහභාගිවූයේ කවුද?

1) තුන්වැනි ෆ්‍රෙඩ්රික් විලියම් 2) චාල්ස් ටැලිරැන්ඩ් 3) කාසල්රි
4) ජෝශප් බොනපාට් 5) මෙටර්නික් ( )

34. ප්‍රථම නොබැඳි ජාතීන්ගේ සමුළුව පැවත්වූයේ කුමන නගරයේදී ද ?

1) ලන්ඩන් 2) ජිනිවා 3) බෙල්ග්‍රේඩ්
4) කල්කටා 5) සැන්ෆ්‍රැන්සිස්කෝ ( )

35. ලුවර් කෞතුකාගාරය ඉදිකරවන ලද අධිරාජ්‍යා කවුද?

1) කොන්ස්ටන්ටයින් 2) ජුලියස් සීසර් 3) ජස්ටීනියන්
4) නැපෝලියන් 5) පෙරික්ලීස් ( )

* 36 සිට 40 දක්වා ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. ඒවාට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි 1,2,3,4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලයදැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදිය | වැරදිය |
| 2 | නිවැරදිය | නිවැරදිය |
| 3 | වැරදිය | වැරදිය |
| 4 | වැරදිය | නිවැරදිය |
| 5 | නිවැරදිය | නැවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවන ප්‍රකාශය | |
|---|---|---|---|
| 36. | මිනෝවාන් හා මයිසීනියානු ශිෂ්ටාචාර යුරෝපය තුළ බිහි වූ පැරණිතම ශිෂ්ටාචාර වේ. | පෞර රාජ්‍ය සම්න්ධයෙන් වඩාත් පැහැදිලි සාක්ෂි හමුවන්නේ රෝමයෙනි. | (   ) |
| 37. | පළමුවන චාල්ස් රජුට ශුද්ධරෝම අධිරාජ්‍ය තනතුර ලැබුනි. | 14 ලුවී රජු තම පාලනය සඳහා දේවවරම් වාදය උපයෝගී කොටගෙන ඇත | (   ) |
| 38. | යුරෝපය නූතන යුගයට පැමිණීමේ ප්‍රධාන බලවේගය වූයේ පුනරුදයයි. | පුනරුදයේදී ආගමික වශයෙන් කතෝලික සභාවේ පැවති ඒකාධිකාරිය බලතල බිඳ දැමූ ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාප්තියක් සිදුවිය. | (   ) |
| 39. | ලැන්කැස්ටර් හා යෝර්ක්වරු අතර ඇතිවූ රෝස යුද්ධයෙන් යෝර්ක් වංශික viii වන හෙන්රි රජු ජයගන්නා ලදී. | 1553 දී කොන්ස්තන්තිනෝපලය තුර්කීන් සතුවිය | (   ) |
| 40. | ඔස්ට්‍රියාවේ සහ ප්‍රංශයේ සහයෝගය ඇතිව බිස්මාක් විසින් ජර්මනිය එක්සත් කරන ලදි. | නැපෝලියන් බර්ලින් හා මිලාන් ආඥා මගින් යුරෝපයේ සියලුම රටවල වෙළඳ පොළ ඉංග්‍රීසින්ගේ භාණ්ඩ සඳහා වසා දැමීමට විධි විධාන යෙදවීය. | (   ) |

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2022
Practice Test - Grade 13 - 2022

යුරෝපා ඉතිහාසය - II

25B S II

යුරෝපා ඉතිහාසය - ග්‍රීක රෝම ශිෂ්ටාචාර අවදියේ සිට ක්‍රි.ව 1989 දක්වා

<u>උපදෙස්</u>

* A කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
* B හා C කොටස් වලින් එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න එක බැගින් තෝරාගෙන ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.
* පිළිතුරු සැපයිය යුතු මුලු ප්‍රශ්න ගණන 4 කි.
* පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා යුරෝපයේ දළ සිතියමක් සපයනු ලැබේ.

## A කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

i. පිරනීස් ii. ක්‍රිමියාව iii. ස්වීඩනය iv. පෝලන්තය

v. කෝසිකා iv. කෝපන්හේගන් vii. රයින් ගග viii.ආන්ද්‍රියාතික් මුහුද

ix. ලිස්බන් x. ඩාඩනල්ස් සමුද්‍ර සන්ධිය xi. බෝල්ටික් මුහුද

x. ජිනෝවා (ල. 12)

## B කොටස

2. පහත දැක්වෙන ක්ෂේත්‍රවල පුරාණ ග්‍රීකයන්ගේ කාර්ය සාඵල්‍යය පරීක්ෂා කරන්න. (ල. 16)

i. ආගම ii. සාහිත්‍ය iii. දර්ශනය

3. පහත සඳහන් කරුණු ඇසුරෙන් මධ්‍යකාලීන යුරෝපයේ වැඩවසම් ක්‍රමය පිළිබඳ විග්‍රහයක් කරන්න

i. ප්‍රවේණිය ii. බල විකේන්ද්‍රණය iii. සාමූහිකත්වය (ල. 16)

4. '' ප්‍රංශ විප්ලවය ආරම්භ කරන ලද්දේ මධ්‍යම පන්තිය විසිනි''

i. ප්‍රංශ විප්ලවය ඇති වීමට තුඩුදුන් ආසන්නතම හේතුව කුමක්ද? (ල. 2)

ii. විප්ලවය ඇතිවීමට පෙර ප්‍රංශයේ පැවති සමාජ ව්‍යුහය සැකෙවින් දක්වන්න. (ල. 3)

iii. ප්‍රංශ විප්ලවය ඇති වීමට තුඩුදුන් හේතු කෙරෙහි අවධානය යොමු කරමින් විප්ලවය ආරම්භ කිරිමෙහි ලා මධ්‍යම පන්තිය විසින් ඉටු කරන ලද කාර්යභාරය විවේචනාත්මකව විමසන්න.

(ල. 11)

5. පහත සඳහන් මාතෘකා අතරින් කැමති මාතෘකා 2ක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

i. 1688 ඉංග්‍රීසි විප්ලවය          ii. රෝමබල ව්‍යාප්තිය

iii. කාර්මික විප්ලවය          iv. දේශගවේශන          (ල. 8x2)

## C කොටස

6. ''ජර්මනිය එක්සත් කළ හැකි වන්නේ'ලේ සහ යකඩ ප්‍රතිපත්තියකින් පමණක් බව බිස්මාක්ගේ පිළිගැනීම විය''. ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරය සම්බන්ධයෙන් මේ කියමන අදාළ වන අයුරු පරීක්‍ෂා කරන්න. (ල. 16)

7. ''යුරෝපය සතුරු බල කඳවුරු දෙකකට බෙදීම පළමුවන ලෝක යුද්ධය ඇතිවීමට බලපෑ ප්‍රධාන සාධකය විය.''

i. පළමුවන ලෝක යුද්ධ සමයේ සිටි ජර්මන් අධිරාජයා කවුද? (ල . 1)

ii. පළමුවන ලෝක යුද්ධය ඇතිවීමට බලපෑ ආසන්නතම හේතුව කුමක්ද? (ල . 2)

iii. යුරෝපය සතුරු බලකඳවුරු දෙකකට බෙදීගිය ආකාරය සැකෙවින් දක්වන්න (ල . 4)

iv. පළමුවන ලෝක යුද්ධය ඇතිවීමට තුඩුදුන් සියලු සාධක සැලකිල්ලට ගනිමින් ඉහත සඳහන් ප්‍රකාශය පරීක්‍ෂා කරන්න. (ල. 9)

8. i. නිරවි යුද්ධය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ල. 7)

ii. නිරවි යුද්ධය යුරෝපයේ දේශපාලනය කෙරෙහි බලපෑවේ කෙසේද? (ල. 9)

9. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න

1) බෝල්ෂවික් විප්ලවය

2) ඉතාලියේ පැසිස්ට්වාදය

3) II වන ලෝක යුද්ධයට බලපෑ හේතු

4) නිරවි යුද්ධය (ල 8 X 2)